## සංචාරක සංවර්ධන අරමුදල - 2012

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1. 2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2012 දෙසැම්බර් 31 දිනට සංචාරක සංවර්ධන අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ කුඩා හා මධ්‍ය පරිමාණ ආයතන සම්බන්ධයෙන් වන ශ්‍රී ලංකා ගිණුම් කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.2.1 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

2004 වර්ෂයේ සිට 2008 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදයට අදාල අගරු චෙක්පත් 8 ක එකතු වටිනාකම වූ රු. 143,504 ක් සඳහා මුදල් රෙගුලාසි 486 ප්‍රකාරව අය කිරීමට හෝ සුදුසු ක්‍රියාමාර්ගයක් ගැනීමට හෝ කටයුතු කර නොතිබුණි.

1.2.2 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති,රීති, රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| 2005 අංක 38 දරන සංචාරක පනතේ 24 (2) වගන්තිය සහ 2003 අංක 25 දරන මුදල් පනතේ 12(2) වගන්තිය | සංචාරක බදු අය කර ගැනීමේ වාර්තා සංචාරක සංවර්ධන බදු (සං.සං.බ) අය කර දින 30 ක් ඇතුළත මහා භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්වරයා වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| 2005 අංක 38 දරන සංචාරක පනතේ 24(3) වගන්තිය | සංචාරක සංවර්ධන බද්ද කළමනාකරණය කිරීම සහ පරිපාලනය කිරීම සඳහා රීති පිළියෙල කර |

නොතිබුණි.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය තුළ අරමුදලේ වැඩ කටයුතුවලින් ඉපයූ ආදායම රු. මිලියන 1,975 ක් වූ අතර, ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ ආදායම රු.මිලියන 1,695 ක් වූයෙන් ආදායමෙහි රු. මිලියන 280 ක වැඩිවීමක් පෙන්නුම් කෙරුණි. සංචාරක සංවර්ධන බදු ආදායම සහ අපගමන බදු ආදායම වැඩි වී තිබීම ආදායමේ වැඩිවීමට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

3.1.1 අරමුදල් කළමනාකරණය

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) ලියාපදිංචි සංචාරක ප්‍රවාහන ආයතනයකින් 2010,2011 සහ 2012 යන වර්ෂවලට අදාලව සංචාරක සංවර්ධන බදු මුදල් රු. 2,603,074 ක් අඩුවෙන් අය කර තිබුණි.

(ආ) අරමුදල මගින් පරිපාලන වියදම් ලෙස රු. 4,162,318 ක මුදලක් ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය වෙත ගෙවා තිබුණි. එසේ වුවත්, පරිපාලන වියදම් ගෙවීමට 2005 අංක 38 දරන සංචාරක පනතින් විධිවිධාන සලසා නොතිබුණි.

(ඇ) 2003 අංක 25 දරන මුදල් පනතේ විධිවිධාන අනුව 2003 අගෝස්තු 29 දිනැති අංක 1303/22 දරන අති විශේෂ ගැසට් නිවේදනය අනුව අපගමන බදු ලෙස ගුවන් යානයකින් හා නැවකින් පිටත්වන සෑම තැනැත්තෙකුගෙන්ම පිළිවෙලින් එක්සත් ජනපද ඩොලර් 15 ක් සහ 2.5 ක් අය කළ යුතු වුවද, මෙම අපගමන බද්ද අය කරන සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් 2004 වර්ෂයේ සිට 2012 දෙසැම්බර් 31 දින දක්වා එක්සත් ජනපද ඩොලර් එකකට රු. 100 ක විනිමය හුවමාරු අනුපාතයක් පදනම්

කරගෙන මෙම බද්ද අය කර තිබීමෙන් සමාලෝචිත වර්ෂයේදී හා ඉකුත් වර්ෂවලදී අරමුදලට ලැබිය යුතු අපගමන බදු සැලකිය යුතු ප්‍රමාණයක් අහිමි වී තිබුණි. එය වර්ෂයකට රු.මිලියන 850 ක් පමණ වන බව හෙළිදරව් විය.

(ඇ) සංචාරක සංවර්ධන බදු අයකර ගත යුතු ආයතන පිළිබඳව දත්ත සමුදායක් සකස් කර නොතිබුණි. තවද ඒ ඒ වර්ෂ වල අය කල බද්ද හා ආයතනවල විකුණුම් ආදායම ලේඛනගත කර නොතිබු හෙයින් හිඟ බදු පිළිබඳව නියාමනයක් සිදු වී නොතිබුණි.

4. පද්ධති හා පාලනයන්

------------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ) ගිණුම්කරණය

(ආ) අරමුදල් බෙදා හැරීම

(ඇ) සංචාරක සංවර්ධන බදු එකතු කිරීම

(ඈ) අපගමන බදු එකතු කිරීම

(ඉ) බලපත්‍ර හිමි ආයතනවල මූල්‍ය වාර්තා සමාලෝචනය